# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2134/3 - 2019 ජූලි මස 29 වැනි සඳුදා - 2019.07.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**නිදහස් කිරීමේ නියෝග අංක 2019/04/25/101/001**

සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනත 1970 අංක 35

**10(4) වගන්තිය යටතේ කරනු ලබන නියෝගය**

කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන ගරු අමාත්‍ය (*වැ.බ.*) බුද්ධික පතිරණ වන මා හට 1970 අංක 35 දරන සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනතේ 10(4) වගන්තිය ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව යටියන්තොට විවිධ සේවා සමුපකාර සමිතියේ කටයුතු පවත්වාගෙන යාමට අංක 108/09 සහ 1974.04.26 දිනැති *ගැසට් පත්‍රයේ* නියෝග ප්‍රකාරව අත්පත් කරගත් පහත උපලේඛනයේ විස්තර කෙරෙන දේපල වර්ෂ 2019 ක් වූ ජූලි මස 17 දින සිට එම දේපලේ හිමිකරුවන් වෙත නිදහස් කරමි.

බුද්ධික පතිරණ,
කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ
පුද්ගලයින් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන
සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන ගරු අමාත්‍ය.(*වැ.බ.*)

2019 ජූලි මස 17 වැනි දින,
කොළඹ දී ය.

*උපලේඛනය*

කැගල්ල දිස්ත්‍රික්කයේ බුලත්ගම් කෝරලේ දෙහිගම්පල් ප්‍රාදේශීය ආදායම් නිලධාරී බල ප්‍රදේශයේ අංක 106 දරන යටියන්තොට ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිහිටි වරිපනම් අංක 07 දරන ගොඩනැගිලි සමග ''බිලිංගහ කොටුව'' නමින් හඳුන්වනු ලබන ඉඩමේ කොටසක් වන රූඩ් 01 පර්චස් 6 ක් විශාල ඉඩමට මායිම්,

| | | |
|---|---|---|
| *උතුරට* | : | කේ. කේ. පී. නොරිස් අප්පුහාමි සහ ඩී. කේ. හෙන්ද්‍රික්ට අයිති වරිපනම් අංක 3 දරන ඉඩම සහ ගොඩනැගිල්ල. |
| *නැගෙනහිරට* | : | එස්. පාතිමා බීබී සහ අනෙකුත් අය හිමිකම් කියනු ලබන ''රත්නගහවත්ත''. |
| *දකුණට* | : | නගරයේ මුස්ලිම් පල්ලියේ අඩිපාර සහ ඉඩම. |
| *බටහිරට* | : | ගිණිගත්හේන ර.වැ.දේ. ප්‍රධාන මාර්ගය. |

08 - 492

1A - G 30613 — 20 (2019/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*